ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2023-05-19

පැමිණිලිකාර පාර්ශවය : ඩබ්.ජ්.ඩී. රුවන් වෙත්තසිංහ මයා,
නො 12 ඒ/1, බෙත්දලුව,
පරකඩුව.

වගඋත්තරකාර පාර්ශවය : අධ්‍යක්ෂ ජනරාල්,
වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
ජයන්තිපුර,
බත්තරමුල්ල.

පැමිණිලි අංකය : HRC/1397/22, HRC/769/22

**පැමිණිල්ලේ කරුණු දැක්වීම =:**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2015-11-11 වන දින වගඋත්තරකාර ආයතනයේ සත්ව නියාමක III තනතුරේ කටයුතු කිරිමට පත්ව ඇති බවත්, ඉන් අනතුරුව 2018-07-22 වන දින පැවැත් වූ තරග විභාගයකින් සහ 2019-02-07 දින සිට 2019-02-13 වන දින තෙක් පැවැති ව්‍යුහගත සම්මුඛ පරික්ෂණයේ ප්‍රතිඵල මත 2019-05-13 දින සිට ක්‍රියාත්මක වන පරිදි පැමිණිලිකරුව වනජිවි සංරක්ෂක දෙපාර්තමේන්තුවේ පුහුණු. වන සත්ව අඩවි ආරක්ෂක තනතුරට පත් කළ බවත්ය.

තවද, මාස 06 ක අනිවාර්ය පුහුණු කාලයක් යටතේ තම පුහුණුව සාර්ථකව නිම කළ බවත්, 2019-11-04 දිනැති ලිපිය ප්‍රකාරව තමාව මාස 06ක පුහුණුව සාර්ථකව නිම කිරිමෙන් පසුව 2019-11-19 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි වන සත්ව අඩවි ආරක්ෂක III ශ්‍රේණියේ තනතුරට පත්කර කටගමුව අඩවි ආරක්ෂක කාර්යාලයට රාජකාරි සඳහා අනුයුක්ත කළ බවත්, දක්වා ඇත. වජි/1/18/අ.ආ.ව.ගැ(විවෘත) හා 2020-01-16 දිනැති වනජිවි ආරක්ෂක අධ්‍යක්ෂක



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ජනරාල්ගේ ලිපිය මගින් පැමිණිලිකරුව වන සත්ව අඩවි ආරක්ෂක III ශ්‍රේණියේ ස්ථිර පත්වීම ද ලබා දුන් බවත් පෙත්සම්කරු පවසා ඇත.

තවද, පැමිණිලිකරු ඔහුගේ දෛනික රාජකාරි කටගමුව වනජීවී අඩවි ආරක්ෂක කාර්යාලයේ සිදු කරමින් සිටියදී වනජීවී සංරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වජී/1/4/1/161 හා 2021-04-30 දිනැති ලිපිය මගින් පැමිණිලිකරුගෙන් 2008 වර්ෂයේ පැමිණිලිකරු පෙනී සිට ඇති අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵලයට අමතරව නැවත වතාකවකදී අ.පො.ස. (උසස් පෙළ) පෙනී සිට ජීව විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා ගත්තේ ද යන්න හා එසේ ලබා ගත්තේ නම් එම සහතිකයේ සහතික කළ පිටපතක් ඉල්ලා ඇති අතර, පැමිණිලිකරු විසින් එම ලිපියේ ඉල්ලීමට අදාළ අ.පො.ස(උසස් පෙළ) සහතිකය වනජීවී සංරක්ෂක දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ බවට ද සඳහන් කර ඇත.

තවද, පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ, කිසිදු විමසීමකින් තොරව වජී/01/04/01/161 හා 2022-01-31 දිනැති ලිපිය මගින් වනජීවී සංරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් පැමිණිලිකරුව 'වනසත්ව අඩවි ආරක්ෂක තනතුරුට අදාළ බඳවා ගැනීමේ පරිපාටියට අනුව වන සත්ව අඩවි ආරක්ෂක III ශ්‍රේණියේ තනතුරට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා නොමැත' යන පදනම මත ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 3.2 වගන්තියට අදාලව පැමිණිලිකරුව වනජීවී සංරක්ෂක දෙපාර්තමේන්තුවේ වනසත්ව නියාමක තනතුරට පෙරළා පත් කළ බවට දක්වා ඇති බවයි. තවද එම ලිපියේ වැඩිදුරටත් '2020-01-16 දිනැති ලිපියෙන් පත් කළ සත්ව අඩවි ආරක්ෂක III වන ශ්‍රේණියේ පත්වීම ද අවලංගු කරන බවත්, උක්ත පත්වීම් සම්බන්ධයෙන් පැමිණිලිකරුට කිසිදු හිමිකමක් නොලැබෙන බවත්, මේ සම්බන්ධයෙන් කරනු ලබන කිසිදු ඉල්ලීමක් මොනම හේතුවක් මත හෝ නැවත සලකා නොලබන බවත්' වගඋත්තරකාර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සඳහන් කළ බවට පැමිණිලිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පැවැති පරීක්ෂණයේදී සඳහන් කර ඇත.

ඒ අනුව 2022-03-30 දිනැති වජී/1/4/1/161 ලිපිය ප්‍රකාරව වනජීවී සංරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් විසින් පැමිණිලිකරුව 2022-02-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වන සත්ව නියාමක III ශ්‍රේණියේ තනතුරේ රාජකාරි කිරීම සඳහා වනජීවී සංරක්ෂක දෙපාර්තමේන්තුවේ ගුරුකුඹුර බිට්ටු කාර්යාලයට අනුයුක්ත කළ බවද දක්වා ඇත.

තවද, ඉහත සඳහන් වන සත්ව අඩවි ආරක්ෂක III ශ්‍රේණියේ තනතුරු සඳහා අධ්‍යාපනික සුදුසුකම් ලෙස 2018-02-16 දිනැති අංක 2059 දරණ ගැසට් පත්‍රය ප්‍රකාරව අංක 4 අයිතමය යටතේ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් සඳහන් කර ඇති බවට පැමිණිලිකරු සැලකර ඇත. පැමිණිලිකරු

එම තනතුරට ඉල්ලුම් කරන විට ඔහුට සැපිරිමට තිබූ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් මෙයින් පැහැදිලිව සඳහන් කොට ඇති අතර. එහි 4.ii හි සඳහන් කර ඇත්තේ. නව විෂය නිර්දේශය යටතේ අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 03කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබිමය. එම සුදුසුකම් වල එකවර මෙම විෂයන් සියල්ල සමත් වීම සම්බන්ධයෙන් කිසිදු සඳහනක් නොමැති බව ද පැමිණිලිකරු විසින් තවදුරටත් පෙන්වා දී ඇත.

ඉහත ගැසට් නිවේදනයේ අයිතමය 4.i අ.පො.ස(සාමාන්‍ය පෙළ) සම්බන්ධයෙන් එක් වරකදී සමත් විය යුතු බව පැහැදිලිව සඳහන් කර ඇති බව සැලකිය යුතු වේ යනුවෙන් පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ. ඔහු මෙම සියලුම සුදුසුකම් සපුරා තරග විභාගයට පෙනී සිට සම්මුඛ පරීක්ෂණයෙන්ද සමත් වූ පසුව වර්ෂ 2 මාස 09ක කාලයක් වනජීවී අඩවි ආරක්ෂක III ශ්‍රේණියේ තනතුරේ රාජකාරි කටයුතු නිසි අයුරින් කරගෙන සිටි අවස්ථාවකදී 2022-01-31 දිනැති ලිපිය මගින් කිසිදු විමසීමකින් තොරව එම තනතුර අහෝසි කිරීම තුළින් ඔහුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට පවසා ඇත.

**වගඋත්තරකරුගේ කරුණු දැක්වීම =:**

පැමිණිලිකරුගේ මෙම පැමිණිල්ල පිළිබඳව පරීක්ෂණය 2023-01-19 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පැවැත් වූ අවස්ථාවේදී ඒ සඳහා සහභාගී වූ වනජීවී සංරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක (පාලන)- චතුර දමගිලිය මහතා 2019 වර්ෂයේ වන සත්ව අඩවි ආරක්ෂක නිලධාරින් බඳවා ගැනීම් සඳහා තරග විභාගයක් සහ එහි ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණය පැවැත් වූ අතර. ඒ පරීක්ෂණයන් දෙකටම පාදක කර ගෙන ඇත්තේ වන සත්ව අඩවි ආරක්ෂක තනතුරට බඳවා ගැනීමේ වර්තමාන පටිපාටිය බවත්. එහි අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ලෙස දක්වා ඇත්තේ.

01. අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ 04ක් සහිතව එකවර වැඩ 06ක් සමත් වීම.
02. අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් නව විෂය නිර්දේශය යටතේ ජීව විද්‍යාවට සම්මාන සාමාර්ථයක් සහිතව විද්‍යා අංශයෙන් වැඩ 03ක් සමත් වීම යන කරුණු වේ.

කෙසේ වෙතත්. මෙම උසස් පෙළ විභාගය සමත් විය යුත්තේ එකවරද යන්න සඳහන් වී නොමැත. තවද වගඋත්තරකාර නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා සඳහන් කර ඇත්තේ. උක්ත තනතුරේ ස්ථිර කිරීමේ කාර්ය සඳහා අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කිරීමේදී පැමිණිලිකරු ඩබ්.ජී.ආර්. වෙත්තසිංහ යන

අය උසස් පෙළ සුදුසුකම් සපුරා ඇත්තේ එක වරකදී නොවන බවත්. ඒ හේතුව මත ඔහුගේ වන සත්ව අධවි ආරක්ෂක III ශ්‍රේණියේ තනතුර අහෝසි කර ඔහුගේ සේවය අවසන් කර ඔහු විසින් දැරූ පැරණි තනතුරට පෙරලා යැවූ බවත් ය. තවද, පැමිණිලිකරු දෙපාර්තමේන්තුවේ වැඩ, පැමිණීම, හැසිරීම, සතුටුදායක බව ද පවසා ඇත.

**නිරීක්ෂණ =:**

මෙම පැමිණිල්ලට අදාලව පැමිණිලි පාර්ශවය හා වගඋත්තරකාර පාර්ශවය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2023-01-19 දින පවත්වන ලද පරීක්ෂණයේදී ඉදිරිපත් කරන ලද කරුණු සැලකිල්ලට ගැනීමේදී,

වන සත්ව අධවි ආරක්ෂක III ශ්‍රේණියේ තනතුර සඳහා අධ්‍යාපනික සුදුසුකම් ලෙස 2018.02.16 දිනැති අංක 2059 දරණ ගැසට් පත්‍රය ප්‍රකාරව අංක 04 යටතේ ඇති අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් වලට අනුව අ.පො.ස(උ.පෙළ) විභාගයෙන් නව විෂය නිර්දේශය යටතේ ජීව විද්‍යාවට සම්මාන සාමාර්ථයක් සහිතව විද්‍යා අංශයෙන් වැඩ 03ක් සමත් විය යුතු බවට දක්වා ඇත. එහිදි එලෙස සමත් විය යුත්තේ එකවර යන්න ගැසට් පත්‍රයේ කිසිදු සටහනක් නොමැති බවටද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු 2007 වසරේදී අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිට ජීව විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් පමණක් ලබාගෙන ඇති නමුත් 2008 වසරේදී විෂයන් 03කටම සාමාන්‍ය සාමාර්ථ ලබාගෙන ඇති බැවින්, උක්ත ගැසට් නිවේදනය ප්‍රකාරව පැමිණිලිකරුට සියලු සුදුසුකම් තිබෙන බවට කරුණු අනාවරණය වේ.

පැමිණිලිකරු තරග විභාගයකින් සමත් වී සම්මුඛ පරීක්ෂණයටද සාර්ථකව මුහුණ දී අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා ගනිමින් වන සත්ව අධවි ආරක්ෂක III තනතුරේ වසර 03කට ආසන්න කාලයක් සාර්ථකව සේවයේ යෙදී සිටියදී ඔහුගේ තනතුර අවලංගු කර සේවය ද අවසන් කර ඇති බවට නිරීක්ෂණය වේ.

මෙම අවස්ථාවේදී පැමිණිලිකරුගේ කරුණු දැක්වීම සහ වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරුගේ සේවය අවසන් කිරීමට පාදක වූ හේතුව කුමක් ද යන්න පිලිබඳව සොයා බැලීමේදී ඉහත අංක 2059 සහ 2018-02-16 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයට අනුව වනජීවී සංරක්ෂක දෙපාර්තමේන්තුව විසින් උක්ත තනතුර සඳහා අයදුම්පත්‍ර කැඳවීමේදී එම ගැසට් පත්‍රයේ අයිතම 4.ii පැමිණිලිකරුට අදාළ වන අතර, එහි සඳහන්

වී ඇත්තේ, ***"නව විෂය නිර්දේශය යටතේ අ.පො.ස(උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථය සහිතව විෂයන් 3කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබිම යනුවෙනි"***.

මෙහිදී සැලකිය යුතු කරුණු වන්නේ කිසිසේත්ම එක්වරකදී මෙම සමත් වීම තිබිය යුතු බවට සඳහනක් නොමැති වීමයි. තවද, උක්ත තනතුර සඳහා වූ අයදුම්කරුවන්ට තිබිය යුතු අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳව අයිතම 4.i දී සඳහන් කර ඇති ආකාරයට ***"අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක්වරකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් 2කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් (06)ක් සමත් වී තිබිය යුතු ය"*** වශයෙන් දක්වා ඇත.

පැමිණිලිකරු වගඋත්තරකාර ආයතනය තුළ සේවය කරමින් සිටියදී අදාළ තනතුරට අයදුම්පත්‍ර කැඳවීම් කර තිබූ අතර, පැමිණිලිකරු එම තනතුරට ඉල්ලීම් කිරීමේදී ඔහු විසින් ආයතනය වෙත කිසිදු කූට ලේඛනයක් හෝ ඉදිරිපත් කර නොමැති අතර, ගැසට් නිවේදනයට අනුව ඔහු විසින් ලේඛන ඉදිරිපත් කර තිබෙන බවත්, ගැසට් නිවේදනයේ විධිවිධාන වලට අනුකූලව ඔහු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පෙනී සිට එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඔහුගේ ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව පැමිණිලිකරු සුදුසු බවට ඒකමතිකව තිරණය කිරීමෙන් පසුව ඔහුට උක්ත තනතුර ලබා දී තිබෙන බවත් පැහැදිලි වේ.

කරුණු එසේ හෙයින් පැමිණිලිකරු වසර 02ක් සහ මාස 09ක කාලයක් අදාළ තනතුරේ සේවය කිරීමෙන් පසුව ගැසට් නිවේදනයට පටහැනිව සඳහන් නොවූ කරුණක් පදනම් කරගනිමින් පැමිණිලිකරුගේ සේවය අවසන් කිරීම කිසිසෙත්ම පිළිගත නොහැකි කරුණක් වන අතර, ගැසට් නිවේදනයට පටහැනිව කටයුතු කිරීමට ද වගඋත්තරකාර පාර්ශවයට කිසිදු අයිතියක් නොමැති බවද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මතය වේ.

**නිගමනය =:**

පැමිණිලිකරුව වගඋත්තරකාර ආයතනය විසින් පත්කරන ලද තනතුරෙන් අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති බවට සලකා සේවය අවසන් කිරීම තුළින් වගඋත්තර පාර්ශවය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාවෙන් සහතික කොට ආරක්ෂා කර දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයට කටයුතු කර ඇති බවට මානව හමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය =:**

ඉහත ගැසට් නිවේදනයට අනුව පැමිණිලිකරු වන සත්ව අඩවි ආරක්ෂක III ශ්‍රේණියේ තනතුරු සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා ඇති බැවින්, පැමිණිලිකරුව උක්ත තනතුරේ සේවය අවසන් කළ දින සිට පෙරදාතම් කර ඔහුට හිමි තනතුරට අදාළ වරප්‍රසාද හා අතිකුත් දීමනා ලබා දීමට කටයුතු කරන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකාර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 06 . 28 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ.
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික).
සභාපති.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

B/